# විදුලිය පිරිමහන මෙරට විදුලි පහන්


අප රටෙහි විදුලිය පිළිබඳ අර්බුදයක් පවතී. විදුලි බලය සම්බන්ධයෙන් මේ රටෙහි සිදුවූ හා සිදුවන වංචා, දූෂණ අක්‍රමිකතා යනාදිය මොනවා වුවත් අද පාරිභෝගිකයාට දැනෙන මූලික ප්‍රශ්නය වනුයේ විදුලි බිල ඉහළ යෑමයි. විදුලිය බිල පහත හෙළන මඟක් වේ නම් එය පාරිභෝගිකයාට ඉමහත් අස්වැසිල්ලකි.

විදුලි බිල අඩුකොටගෙන රටෙහි විදුලිබල වාර්තාව ඉතිරි කර ගත හැකි එක් විද්‍යුත්මක මඟකි අධි සංඛ්‍යාත බැලැස්ටර් සහිත ලාම්පු නිපදවීම හා සුසංහිත ප්‍රතිදීප්ත විදුලි බුබුලු ක්‍රමය. මෙම නවීනතම ක්‍රම නිසා අඩු වොට් ප්‍රමාණයක විදුලි පහනක් මඟින් වැඩි වොට් ප්‍රමාණයක ආලෝකයක් ලබාදෙයි.

ගෙදර දෙර මෙන්ම අනෙකුත් ගොඩනැගිලිවල ආලෝකකරණය සඳහා ද සූත්‍රිකා බල්බ බහුල ලෙස භාවිතා කිරීමට අපි පුරුදු වී සිටිමු. එහෙත් මෙම පහන් භාවිතා කිරීමේදී යොදවනු ලබන විදුලි බල ප්‍රමාණයෙන් සියයට 90 ක් 95 ක් පමණ තාපය ලෙස පරිසරයට අපතේ යන බව බොහෝ දෙනෙක් නොදනිති. එම නිසා මෙම අකාර්යක්ෂම විදුලි පහන් වෙනුවට වඩාත් කාර්යක්ෂම ප්‍රතිදීප්ත පහන් භාවිතයට ඉක්මනින් හුරු විය යුතු කාලයකට අපි එළඹ සිටිමු.

සාමාන්‍යයෙන් ප්‍රතිදීප්ත විදුලි පහනක් ක්‍රියාත්මක කිරීමට බැලැස්ටරය නැමැති උපාංගය අත්‍යවශ්‍යය. ප්‍රතිදීප්ත පහන් සමග භාවිත වන මේ බැලැස්ටරය තුළ ද යම්කිසි විදුලි බල ශක්ති ප්‍රමාණයක් හානි වීම සිදුවන අතර ප්‍රතිදීප්ත පහනක කාර්යක්ෂමතාව තවදුරටත් වැඩිකිරීමට මෙම බැලැස්ටරය තුළ සිදුවන ශක්ති හානිය අවම කිරීම වැදගත් වෙයි. මේ අනුව දැනට භාවිතයේ පවතින විද්‍යුත් වර්ගයේ බැලැස්ටරය වෙනුවට වඩාත් කාර්යක්ෂම බැලැස්ටර් නිපදවීමට මෙන්ම වොට් 11 සුසංහිත විදුලි බුබුලකින් වොට් 60 ක එළියක් ලබා ගත හැකි වූත්, සියයට 80 ක විදුලිය පිරිමැසීමක් ඇතිවූත්, විදුලි බල මංඩලයෙන් අනුමැතිය ලත් මෙම සුසංහිත විදුලි බුබුලු නිපදවන දේශීය ආයතනයක් වන රූනික් ඉලෙක්ට්‍රොනික් සමාගමේ අධ්‍යක්ෂ ඒ. ඩී. යූ. අල්විස් මහතාගෙන් සුසංහිත විදුලි බුබුලු පිළිබඳ අපි විමසීමු. පිටරටින් ආනයනය කර වූ සුසංහිත විදුලි පහන් ගලවා එය අධ්‍යයනය කර හා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු සහ සංවර්ධන මධ්‍යස්ථානයේ උපදෙස් මත විශ්ව විද්‍යාලයයේ ඉගෙනුම ලබන අවධියේ සිටම මෙම විදුලි පහන් නිෂ්පාදනය කරනු ලැබූ මොහු දැන් සේවකයන්ද යොදවා ගනිමින් විදුලි බුබුලු නිපදවන කර්මාන්ත ශාලාවක් අරඹා ඇත.

විදේශ ධන අයෝජකයන්ට හා මහා පරිමාණ බහු ජාතික සමාගම්වලට ලබාදෙන ආකාරයේ කිසිදු විශේෂ වරප්‍රසාදයකින් තොරව වෙළඳ පොළට හඳුන්වා දී ඇති මෙකී නව විදුලි බුබුලුවල ආයු කාලය පැය දස දහසකි.




අවුරුද්දක් ඇතුළත මෙම විදුලි පහන් ක්‍රියා විරහිත වුවහොත් අලුත්විදුලි බුබුලක් ලබාදීමේ වගකීමද සමාගම බාර ගනී.

සාමාන්‍යයෙන් නිවසක් තුළ දිනකට පැය පහ බැගින් විදුලි බුබුල දැල්වුවහොත් වසර පහක් පමණ මෙය භාවිතා කළ හැකි යයි සමාගමේ මතයයි. එහෙත් වසර පහක් තුළ සාමාන්‍ය සූත්‍රිකා පහන් හය ක් හෝ හතක් භාවිතා කළ යුතු වේ.

දැනටමත් වගකිව යුතු ආයතනවලට මෙම විදුලි බුබුලු අලෙවි කොට භාවිත කෙරේ.

මෙම සමාගම රජයට ගෙවිය යුතු සියලු බදු ගෙවීමෙන්ද පසු එක් විදුලි බුබුලක් අලෙවි කරන අවම මිල රු. 395/- කි. තවද මෙය දැසට ප්‍රියවන අන්දමේ සුදු වර්ණයෙහි ප්‍රභේදවලින් 'දීප්තිමත් සුදු' හා 'අඩු දීප්තිමත් සුදු' වශයෙන් ලබාගත හැකිය. සුසංහිත විදුලි පහන් වර්ග හතක් දැනට නිෂ්පාදනය කරයි.

**ඒ. එස්. එල් – 22**

සාමාන්‍ය හෝල්ඩරයට සවිකළ හැකි වොට් 22 රවුම් ටියුබයකි. මෙම ටියුබය ඉන්දුනීසියාවෙන් ආනයනය කරයි. රු. 440/- කට මිල නියම කර ඇත.

**එක්සෙල්**

සම්පූර්ණ ආවරණය සහිත, මාරු කළ හැකි, වොට් 22 ටියුබයක් ඇත. සාමාන්‍ය හෝල්ඩරයට හෝ සිවිලිමට සවිකළ හැක. ටියුබය ඉන්දුනීසියාවෙන් ආනයනය කරයි. මිල රු. 595/- කි.

**සී. එෆ්. එල්. ඩී.**

කම්පැක්ට් වොට් 13 "දීප්තිමත් සුදු" හෝ "අඩු දීප්තිමත් සුදු" වර්ණ ප්‍රභේදවලින් ලබාගත හැකිය. සාමාන්‍ය හෝල්ඩරයට සවි කළ හැකි. මිල රු. 595/- කි.

**සී. එෆ්. එල්. – එස්**

වොට් 7 හා වොට් 9 දීප්තිමත් සුදු හා අඩු දීප්තිමත් සුදු වර්ණ ප්‍රභේදවලින් ලබාගත හැකිය. සාමාන්‍ය හෝල්ඩරයට සවිකළ හැක. මිල රු. 495/- කි.

**සී.එෆ්.එල්.පී. – ආර්. ඩී.**

සිවිලිමට හෝ බිත්තියට සවිකළ හැකි වොට් 13 දීප්තිමත් සුදු හෝ අඩු දීප්තිමත් සුදු වර්ණ ප්‍රභේදවලින් ලබාගත හැකිය. බල්බය මාරු කළ හැක. ගැලුක්ස් ටියුබය සහිතය. මිල රු. 595/- කි.

**සී.එෆ්.එල්.පී. – ආර්.එෆ්.**

සිවිලිමට හෝ බිත්තියට සවි කළහැකි වොට් 5 හා වොට් 9 කම්පැක්ට් ටියුබය හෝ වොට් 7 හා වොට් 9 ගැලුක්ස් ටියුබය සහිතය. මිල රු. 450 කි.

**ඉකොනොමි**

සාමාන්‍ය හෝල්ඩරයට සවිකළ හැකිය. ඉන්දුනීසියාවෙන් ආනයනය කරන ටියුබය වොට් 10 කි. මිල රු. 395/- කි.

රජය මඟින් තීරුබදු හා වෙනත් සහනයක් ලබා දෙන්නේනම් අවුරුද්දක වගකීමද සහිත ලොව ඕනෑම රටක නිෂ්පාදනය කරන මෙවැනි විදුලි බුබුලකට නොදෙවෙනි සුසංහිත විදුලි බුබුලක් දැනට වඩා අඩු මිලකට ලබා දිය හැකි බව මෙම සමාගමේ බලධාරියෙක් පැවසීය. එපමණක් නොව විදේශ රටවලින් ගෙන්වන ඇනවුම් හෝ වෙනයම් අවශ්‍යතාවන් මොවුනට ලබාදෙන්නේ නම් වැඩි පිරිසකට රැකියා සැපයිය හැකි කර්මාන්තශාලා ඇරඹිය හැකි බවද ඔවුන්ගේ අදහසයි.

**ඉන්දික කුඩාහෙට්ටි**